සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade } 08 ශ්‍රේණිය

# විද්‍යාව I, II

කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } ..........................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..........................................

## I කොටස

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. මිනිස් සිරුරේ විශාලතම අවයවය කුමක් ද?
(1) අක්මාව (2) සම (3) හෘදය (4) වකුගඩුව

02. ශාක පත්‍රවල ප්‍රධාන කෘත්‍යය වන්නේ,
(1) ආහාර සංචිත කිරීමයි. (2) ප්‍රභාසංශ්ලේෂණය කිරීමයි.
(3) නව ශාක බෝ කිරීමයි. (4) වායු හුවමාරුව සිදු කිරීමයි.

03. වස්තුවක් තත්පර 5 කදී කම්පන වාර 50 ක් ඇති කරයි නම් එහි සංඛ්‍යාතය වන්නේ,
(1) 100 Hz ය. (2) 250 Hz ය. (3) 15 Hz ය. (4) 10 Hz ය.

04. ආකන්දි මුල් සහිත ශාකයකි.
(1) බුලත් (2) කැරට් (3) නුග (4) ඕකිඩ්

05. රාත්‍රී අහසේ දෘශ්‍ය පිහිටීම වෙනස් නොවන තාරකාව,
(1) ඇල්ෆා සෙන්ටෝරි වේ. (2) ධ්‍රැව තාරකාව වේ. (3) පොලක්ස් වේ. (4) සිරියස් වේ.

06. රූපාන්තරණයේ දී "ශිශු " අවධිය දැකිය හැකි ජීවියෙකු වන්නේ,
(1) සමනලයා ය. (2) මදුරුවා ය. (3) කැරපොත්තා ය. (4) පළතුරු මැස්සා ය.

07. පහත දී ඇති රූපයේ A හා B මගින් නිරූපණය වන්නේ.
(1) වලා අකුණු, පෘථිවි අකුණු වේ.
(2) පෘථිවි අකුණු, වා අකුණු වේ.
(3) පෘථිවි අකුණු, වලා අකුණු වේ.
(4) වා අකුණු, පෘථිවි අකුණු වේ.




08. A - සල්ෆර්, B - මැග්නීසියම්, C - අයඩීන් යන මූලද්‍රව්‍ය රත් කළ විට රසායනික විපර්යාසයකට භාජනය වන්නේ,
(1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි. (4) A,B හා C සියල්ලමය

09. මී මැස්සන් දෂ්ඨ කළ විට එහි වේදනාව සමනය කිරීමට වඩාත් සුදුසු ක්‍රමවේදය වන්නේ,
(1) ඇල් ජලයෙන් සේදීම ය. (2) දෙහි යුෂ ආලේප කිරීම ය. (3) හුණු ආලේප කිරීම ය. (4) මී පැණි ආලේප කිරීම ය.

10. චුම්භක සම්බන්ධයෙන් ලබා දී ඇති පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර වනුයේ,
A - අධික තාපයට බඳුන් වීමෙන් චුම්බක බලය හානි වේ.
B - මාලිමා කටුව, උතුර දකුණ දිශා ඔස්සේ පිහිටයි.
C - ස්ථිර චුම්බක තැනීම සඳහා මෘදු යකඩ යොදා ගනී.
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A,B හා C සියල්ලමය.

11. පෘථිවි පරිභ්‍රමණය හා පෘථිවි අක්ෂය, පෘථිවි කක්ෂයට ආනතව පිහිටීම නිසා ඇතිවන සංසිද්ධියක් වනුයේ,
(1) චන්ද්‍රකලා ඇතිවීමයි. (2) සූර්ය ග්‍රහණ ඇති වීමයි.
(3) ඍතු විපර්යාසය ඇති වීමයි. (4) චන්ද්‍ර ග්‍රහණ ඇති වීමයි.

12. රූපයේ දැක්වෙන ඉවතලන පැන් බට භාවිතා කරමින් සකස් කරගත් සංගීත භාණ්ඩයේ සංඛ්‍යාතය වැඩි ස්වරයක් ලබා ගැනීමට පිඹීම කළ යුතු ස්ථානය කුමක් ද?
(1) A (2) B
(3) C (4) D



13. බිංදුදය හා උත්ස්වේදනය සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) උත්ස්වේදනයේදී හා බිංදුදයේදී ජලය වාෂ්ප ආකාරයෙන් පිටවේ.

(2) උත්ස්වේදනය රාත්‍රී කාලයේ ද, බිංදුදය වැඩිපුර දිවා කාලයේ දී ද සිදුවේ.

(3) වායුගෝලීය ආර්ද්‍රතාවය වැඩි වන විට බිංදුදයේ හා උත්ස්වේදනයේ සීඝ්‍රතාව වැඩි ය.

(4) උත්ස්වේදනයේ දී ජලය පමණක් පිටවන අතර බිංදුදයේ දී ලවණ වර්ග ද පිටවේ.

14. මෙහි දී ශුද්ධ පරිවහනය වන අංශු වර්ගය හා දිශාව වන්නේ,

(1) ලුනු - A සිට B දක්වා ය.

(2) ජලය - A සිට B දක්වා ය.

(3) ලුනු - B සිට A දක්වා ය.

(4) ජලය - B සිට A දක්වා ය.




15. රන් භාණ්ඩ රසදිය සමග ගැටීමේ දි රන් භාණ්ඩවලට හානි සිදුවේ. මෙයට හේතුව වනුයේ,

(1) රන් අසන්තත වීමයි.
(2) රසදිය අසන්තත වීමයි.
(3) රන් හා රසදිය අසන්තත වීමයි.
(4) රසදිය ද්‍රවයක් ලෙස පැවතීමයි.

16. බල්බයේ දෙකෙළවර විභව අන්තරය මැනීම සඳහා වෝල්ට්මීටරය නිවැරදිව සම්බන්ධ කර ඇති පරිපථ සටහන කුමක් ද?

(1)



(2)



(3)



4)



17. විද්‍යා ගුරුතුමාගේ උපදෙස් පරිදි සිසුන් කිහිප දෙනෙකු පහත දැක්වෙන ක්‍රියාකාරකම පන්තියේ දී සිදු කිරීම තුළින් නිගමනය කරනු ලබන්නේ,



(1) පුද්ගලයින්ගේ ස්නායු ආවේග ගමන් කරන වේගය වෙනස් බව ය.

(2) පුද්ගලයින්ගේ අත් වල ක්‍රියාකාරීත්වය සන්සන්ධනය කිරීම ය.

(3) වස්තුවක් පහලට වැටෙන වේගය නිරීක්ෂණය කිරීම ය.

(4) වස්තුවක් කෙරෙහි ගුරුත්වාකර්ෂණ බලපෑම නිරීක්ෂණය කිරීම ය.

18. විද්‍යුත් ධාරාවේ රසායනික ඵලය ප්‍රයෝජනයට යොදා ගන්නා අවස්ථාවක් වන්නේ,

(1) රිදී ආභරණ මත රන් ආලේප කිරීමට ය.

(2) යකඩ ඉහළට ගැනීමට විද්‍යුත් දොඹකරය භාවිතා කිරීමට ය.

(3) විදුලි ස්ත්‍රික්කයෙන් රෙදි මැදීමට ය.

(4) යකඩ පෑස්සීමට ඊයම් යොදා ගැනීමට ය.

19. අවස්ථා විපර්යාසය හා එයට අදාල උදාහරණය නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,

A විලයනය - අයිස් කැට ද්‍රව අවස්ථාවට පත්වීම.

B ඌර්ධවපාතනය - අයඩීන් කැට රත්කිරීම.

C වාෂ්පීකරණය - ජලය හුමාලය බවට පත්වීම.

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා C පමණි.
(4) A,B හා C සියල්ලම ය.

20. අකුණු ඇතිවිය හැකි අවස්ථාවල දී **නොකළ** යුතු ක්‍රියාවක් වන්නේ,

(1) හුදකලාව ඇති උස් ගස් අසල රැඳී සිටීම ය.
(2) විදුලි උපකරණ විසන්ධි කර තැබීම ය.
(3) රූපවාහිනී ඇන්ටෙනා එම යන්ත්‍රවලින් විසන්ධි කර තැබීම ය.
(4) රැහැන් සහිත දුරකතන භාවිතයෙන් වැළකීම ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01(A) එක්තරා චොක්ලට් දවටනයක පහත තොරතුරු ඇතුළත් කර තිබුණි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අඩංගු ද්‍රව්‍ය - ග්ලූකෝස්, කිරි
- කොකෝවා සාරය
  E299, E291
- ශුද්ධ බර - 100g
- ISO 9001 , SLS 326
- නිෂ්පාදිත දිනය - 2023.11.09
- කල් ඉකුත්වන දිනය - 2024.11.09

(i) ආහාරයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා මෙහි යොදා ඇති දත්ත 02 ක් ලියන්න.

(ii) මෙම චොක්ලට් වර්ගය භාවිතයට සුදුසු බවට දක්වා ඇති ප්‍රමිති සහතික 02 ක් ලියන්න.

(iii) මෙම නිෂ්පාදනයේ ප්‍රමිතිකරණයට අදාලව සඳහන් කර ඇති අංක ලබා දී ඇති ආයතනය නම් කරන්න.

(iv) අද දින වන විට මෙම චොක්ලට් නිෂ්පාදනය ආහාරයට නුසුදුසු බව ශිෂ්‍යයෙකු පවසයි. එම ප්‍රකාශය සනාථ කෙරෙන තොරතුර කුමක් ද?

(B) ආහාර පරිරක්ෂණය කිරීම අතීතයේ සිට ම විවිධ ආකාරයෙන් සිදු කරන ලදී.

(i) (a) ආහාර පරිරක්ෂණයේ සාම්ප්‍රදායික ක්‍රම 2 ක් ලියන්න.

(b) සූර්ය තාප වියලනය භාවිතා කර ආහාර වියළීමේ වාසි 02 ක් ලියන්න.

(ii) නරක් වූ ආහාරයක ලක්ෂණ 2 ක් ලියන්න.

(iii) දින කිහිපයක් පරණ වූ පාන් පෙත්තක සුදු හා කළු පැහැති පැල්ලම් දක්නට ලැබුණි. මීට හේතු වූ දිලීරය නම් කරන්න.

(vi) ආහාරයක පහත සඳහන් වෙනස්කම් ඇති වන්නේ ආහාරයේ කවර පෝෂ්‍ය පදාර්ථ බහුල අවස්ථා වලදී ද?

(a) පැසීම (b) මුඩුවීම (c) පූතිභවනය

02 (A) ශාක පත්‍රයක පිෂ්ඨය අඩංගු වේ දැයි පරීක්ෂා කිරීමට විද්‍යාගාරයේ දී ආදර්ශනය කල ක්‍රියාකාරකමක පියවර කිහිපයක් පහත දැක්වේ.




(i) X හා Y පියවර ඉටුකිරීමට හේතු දෙක පිළිවෙලින් ලියන්න.

(ii) Y පියවරට අදාලව ලැබෙන නිරීක්ෂණය කුමක් ද?

(iii) Z පියවර සඳහා සුදු පාට පිඟන් ගඩොලක් යොදාගෙන ඇත. එයට හේතුව කුමක් ද?

(iv) (a) ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියේ ප්‍රධාන ඵලය හා අතුරු ඵලය පිළිවෙලින් නම් කරන්න.

(b) එම ප්‍රධාන ඵලය ශාක දේහය පුරා පරිවහණය වන්නේ කුමන සංයෝගයක් ලෙස ද?

(B) විවිධ කාණ්ඩවලට අයත් සතුන් කිහිප දෙනෙකුගේ රූප සටහනක් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
|  කැරපොත්තා |  තල්මසා |  ගෙම්බා |  ජෙලිෆිෂ් |  කැස්බෑවා |

(i) මෙම සතුන් අතරින් පෘෂ්ඨවංශී හා අපෘෂ්ඨවංශී සතුන් දෙදෙනෙකු බැගින් ලියන්න.

(ii) ජලයේ ජීවත්වන ක්ෂීරපායී සත්ත්වයෙකු නම් කරන්න.

(iii) පහත දැක්වෙන ලක්ෂණ සහිත සත්ත්ව කාණ්ඩය නම් කරන්න.

(a) ග්‍රන්ථි සහිත තෙත් සමක් පැවතීම. (b) අරීය සමමිතියක් දැරීම.

03 (A) 8 ශ්‍රේණියේ සිසු කණ්ඩායම් දෙකක් විසින් විද්‍යුතයේ විවිධ ඵල ආදර්ශනයට සකස් කළ ඇටවුම් දෙකක රූපසටහන් පහත දැක්වේ.




(i) (X) හා (Y) ඇටවුම් දෙකෙන් ආදර්ශනය කරන විද්‍යුතයේ ඵල දෙක පිළිවෙලින් නම් කරන්න.

(ii) (X) ඇටවුමට අදාල ඵලය වැඩි කර ගත හැකි ක්‍රම දෙකක් ලියන්න.

(iii) (Y) ඇටවුමේ D හා S ලෙස නම් කර ඇති උපාංග දෙකේ පරිපථ සංකේත දෙක පිළිවෙලින් ඇඳ පෙන්වන්න.

(B) එදිනෙදා ජීවිතයේ දී විවිධ කාර්යයන් සඳහා චුම්බක භාවිතා කරනු ලැබේ.

(i) (a) ''චුම්බක ද්‍රව්‍ය'' යනු මොනවා ද?

(b) වඩා ප්‍රබල චුම්බක තැනීම සඳහා යොදා ගන්නා මිශ්‍ර ලෝහය කුමක් ද?

(ii) මාලිමාවක් ආධාරයෙන් චුම්බක ක්ෂේත්‍රයේ දිශාව හඳුනා ගැනීමට පරීක්ෂණයක් සිදු කරන ලදී. එහි A හා B අවස්ථා දෙකේ දී මාලිමා කටුව පිහිටන ආකාරය රවුම් තුල අඳින්න.




(iii) ඉහත ක්‍රියාකාරකම අනුව චුම්බක ක්ෂේත්‍රයේ දිශාව සඳහන් කරන්න.

04(A) P, Q හා R සිසු කණ්ඩායම් තුනක් විසින් සිදු කරන ක්‍රියාකාරකම්වලට අදාල උපකරණ හා ද්‍රව්‍ය පහත ලෙස වර්ග කර මේස මත තබා ඇත.

| P | Q | R |
|---|---|---|
| අයිස් කැට | තනුක හයිඩ්‍රොක්ලෝරික් අම්ලය | ගිණිකූරු, දාහකය |
| බීකරය | සින්ක් ලෝහ කැබලි | කැකෑරුම් නලය |
| තෙපාව | පරීක්ෂා නලය | බැලූනය |
| දාහකය | | තෙදඬු තුලාව |

ඉහත කණ්ඩායම් වලට පවරන ලද ක්‍රියාකාරකම් ඇසුරින්,

(i) භෞතික විපර්යාසයක් හා රසායනික විපර්යාසයක් නිරීක්ෂණය කරන කණ්ඩායමක් බැගින් ලියන්න.

(ii) (a) ස්කන්ධ සංස්ථිති නියමය තහවුරු කිරීමට අදාල කණ්ඩායම නම් කරන්න.

(b) ස්කන්ධ සංස්ථිති නියමය සත්‍ය බව සනාථ කිරීමට ලබා ගත යුතු පාඨාංක දෙක සඳහන් කරන්න.

(iii) Q කණ්ඩායම පරීක්ෂණය සිදු කිරීමේ දී ලැබෙන නිරීක්ෂණයක් ලියන්න.

(B) ලෝහ වාතයට විවෘතව දිගු කාලයක් තැබූවිට එහි පෘෂ්ඨයේ ස්වභාවය වෙනස් වේ.

(i) මෙසේ ලෝහ පෘෂ්ඨයේ ස්වභාවය වෙනස් වීම කෙසේ හැඳින්වේ ද?

(ii) යකඩ මල බැඳීමට අවශ්‍ය සාධකයක් පරීක්ෂා කරන ඇටවුමක රූපයක් පහත දැක්වේ.




(a) මෙම ඇටවුම මගින් යකඩ මල බැඳීමට අදාල කුමන සාධකය පරීක්ෂාවට ලක් වේ ද?

(b) මෙහිදී ලැබෙන නිරීක්ෂණය කුමක් ද?

(c) මෙහි සිලිකා ජෙල් යොදා ගැනීමට හේතුව කුමක් ද?

(iii) යකඩ මල බැඳීමෙන් ආරක්ෂා කර ගැනීමට යොදා ගන්නා උපක්‍රමයක් ලියන්න.

05(A) සෞරග්‍රහ මණ්ඩලය හා අභ්‍යාවකාශ ගවේෂණය පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම නිපුනගේ විනෝදාංශය වේ.

(i) නිපුන ලග පුවත්පතක පල වූ ග්‍රහණ ඇති වීමට අදාල රූප සටහනක් පහත දැක්වේ.




(a) රූපයේ දැක්වෙනේ කුමන ග්‍රහණයක් ද?

(b) මෙම ග්‍රහණය සිදු වන්නේ කුමන දිනයකදී ද?

(c) A හා C පිහිටීම්වලට අදාල ග්‍රහණ ආකාර දෙක පිළිවෙලින් නම් කරන්න.

(ii) පෘථිවිය වටා පළමුවරට පරිභ්‍රමණය කරවන ලද කෘතිම චන්ද්‍රකාව කුමක් ද?

(iii) සන්නිවේදන පහසුකම් ලබා ගැනීම සඳහා භූ ස්ථායී චන්ද්‍රිකා පිළිබඳ අදහස ඉදිරිපත් කළ විද්‍යාඥයා නම් කරන්න.

(B) රාත්‍රී අහසේ තරු යා කර පැරැන්නෝ විවිධ රූප මවා ඒවා විවිධ නම් වලින් හඳුන්වන ලදී.

(i) මෙසේ නම් කර ඇති තරු රටා හෙවත් තාරකා මණ්ඩල ගණන කීයද?

(ii) (a) රාත්‍රී අහසේ නිරීක්ෂණය වන දීප්තිමත්ම තරුව කුමක් ද?

(b) එම තරුව අයත් තරු රටාව කුමක් ද?

(iii) තරු අතර දුර මනින ඒකකය කුමක් ද?

(vi) තරුවක උන්නතාංශය මැනීම සඳහා භාවිතාවන උපකරණය කුමක් ද?

06(A) මිනිසාගේ ආහාර අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විවිධ බෝග වගා කිරීම සිදු කළද පළිබෝධ හානිය කෘෂිකර්මාන්තයට විශාල තර්ජනයක් වී ඇත.

(i) (a) පූර්ණ රූපාන්තරණය පෙන්වන පළිබෝධකයෙක් නම් කරන්න.

(b) එම ජීවියාගේ ජීවන චක්‍රයේ අවස්ථා පිළිවෙලින් නම් කරන්න.

(ii) වී වගාවේ අස්වැන්න අඩු කිරීමට හේතුවන ශාක පළිබෝධකයෙක් නම් කරන්න.

(iii) (a) පරිසර හිතකාමී වූ පළිබෝධ පාලනය සඳහා යොදාගත හැකි ක්‍රමයක් ලියන්න.

(b) රසායනික පළිබෝධනාශක අධිකව හා අපරීක්ෂාකාරීව යෙදීම නිසා මිනිසාට බලපෑ හැකි අහිතකර තත්වයක් සඳහන් කරන්න

(B) ස්වභාවික ආපදා පිළිබඳ පුවත්පත් වල පළ වූ ශීර්ෂපාඨ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| **ඇතින්නයි පැටවු තිදෙනයි අකුණු සැරට බිලි** | **පස් කන්දක් කඩා වැටී ගෙවල් 03 ක් ජීවිත 06 ක් බිලි ගනී** |

(i) ස්වභාවික ආපදාවක් යනු කුමක් දැයි හඳුන්වන්න.

(ii) (a) නියගය ඇති වීමට බලපෑ හැකි මිනිස් ක්‍රියාකාරකමක් ලියන්න.

(b) නාය යෑමක පෙර සළකුණක් සඳහන් කරන්න.

(iii) ස්වභාවික ආපදාවලින් සිදුවිය හැකි හානිය අවම කර ගැනීමට පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024
ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Final Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade 8

# විද්‍යාව - පිළිතුරු පත්‍රය

කාලය / நேரம் / Time: පැය දෙකයි / Two Hours

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. (02) | 06. (03) | 11. (03) | 16. (03) |
| 02. (02) | 07. (03) | 12. (01) | 17. (01) |
| 03. (04) | 08. (02) | 13. (04) | 18. (01) |
| 04. (02) | 09. (03) | 14. (02) | 19. (04) |
| 05. (02) | 10. (01) | 15. (03) | 20. (01) |

## II කොටස

01.(A) i. නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වන දිනය, ප්‍රමිතිය ආදී ලක්ෂණ 02 ක් සඳහා ---- (02)

ii. ISO 9001 හා SLS 326 ---- (02)

iii. යුරෝපා සංගමය ---- (01)

iv. අදට කල්ඉකුත්වන දිනය ඉක්මවා තිබීම ---- (01)

(B) i. a. ලුනු දැමීම, දුම් ගැසීම, වැලි යට දැමීම වැනි නිවැරදි පිළිතුරු සඳහා ---- (02)

b. අපද්‍රව්‍ය මිශ්‍ර නොවීම, සතුන්ගෙන් හානි සිදු නොවීම, වැස්සෙන් සිදුවන හානිය වළක්වා ගැනීම වැනි පිළිතුරු 02 ක් සඳහා ---- (02)

ii. වර්ණය වෙනස් වීම, ගන්ධය, වයනය වෙනස් වීම වැනි පිළිතුරු 02 ක් සඳහා ---- (02)

iii. මියුකර් ---- (01)

iv. a. සීනි b. ලිපිඩ c. ප්‍රෝටීන් ---- (03)

**16**

02.(A) i. X -ශාක පත්‍රයේ සෛල අජීවී කිරීම සඳහා

Y - ශාක පත්‍රයේ හරිතප්‍රද ඉවත් කිරීම සඳහා ---- (02)

ii. (අවර්ණ) මධ්‍යසාර කොළපාට වීම / කොළපාට ශාක පත්‍රය ලා කහ පැහැ වීම ---- (01)

iii. වර්ණ විපර්යාසය පැහැදිලිව නිරීක්ෂණය කිරීම සඳහා (නිරීක්ෂණ ලබාගැනීමේ පහසුව සඳහා) ---- (01)

iv. a. ප්‍රධාන ඵලය - ග්ලූකෝස්

අතුරු ඵලය - ඔක්සිජන් ---- (01)

b. සුක්රෝස් ---- (01)

(B) i. පෘෂ්ඨ වංශී - තල්මසා, ගෙම්බා, කැස්බෑවා

අපෘෂ්ඨ වංශ - කැරපොත්තා, ජෙලිෆිෂ් ---- (02)

ii. තල්මසා ---- (01)

iii. a. - ඇම්ෆිබියා b. - නිඩාරියා ---- (02)

**11**

03.(A) i. X - චුම්භක ඵලය Y - ප්‍රකාශ (ආලෝක) ඵලය ---------- (02)

ii. ධාරාවේ විශාලත්වය වැඩි කිරීම, දඟරයේ පොටවල් ගණන වැඩි කිරීම, දඟර මධ්‍යයේ සන්නායක මාධ්‍යයක් යොදා තිබීම (ක්‍රම 02 ක් සඳහා) ---------- (02)

iii. D -  S -  ---------- (02)

(B) i. a. චුම්භක වෙත ආකර්ෂණය වන ද්‍රව්‍ය ---------- (01)

b. ෆෙරයිට් ---------- (01)

ii. A -  B -  ---------- (02)

iii. a. උත්තර ධ්‍රැවයේ (N) සිට දක්ෂිණ ධ්‍රැවය (S) දක්වා ---------- (01)

11

04.(A) i. භෞතික විපර්යාසය - P
රසායනික විපර්යාසය - Q / R ---------- (02)

ii. a. R ---------- (01)

b. ප්‍රතික්‍රියාවට පෙර ස්කන්ධය හා ප්‍රතික්‍රියාවෙන් පසු ස්කන්ධය ---------- (02)

iii. සින්ක් ලෝහ කැබලි දියවීම / වායු බුබුළු දිය වීම / පරීක්ෂා නලය රත්වීම වැනි එක් නිරීක්ෂණයක් සඳහා ---------- (01)

(B) i. ලෝහ මලින වීම ---------- (01)

ii. a. ජලය / ජල වාෂ්ප ---------- (01)

b. නලය ඇතුල් පැත්තේ යකඩ ඇණ කොටස් මල බැඳී නැති අතර පිටත ඇති කොටස් වල මල බැඳී තිබීම ---------- (01)

c. (නලය ඇතුලේ ඇති) ජල වාෂ්ප අවශෝෂණය කිරීම ---------- (01)

iii. සුදුසු උපක්‍රමයක් සඳහා ---------- (01)

11

05.(A) i. a. චන්ද්‍රග්‍රහණය ---------- (01)

b. පසළොස්වක දිනයක ---------- (01)

c. A - උප ඡායා චන්ද්‍රග්‍රහණය
C - පූර්ණ චන්ද්‍රග්‍රහණය ---------- (02)

ii. ස්පුට්නික් -1 ---------- (01)

iii. ආතර් සී ක්ලාක් මහතා ---------- (01)

(B) i. 88 ---------- (01)

ii. (a) සීරියස් (b) මහ බල්ලා ---------- (02)

iii. ආලෝක වර්ෂ ---------- (01)

iv. ආනතිමානය ---------- (01)

11

06.(A) i. a. පළතුරු මැස්සා / පොල්කුරුමිනියා ---------- (01)

b. බිත්තර → කීටයා → පිළවා → සුහුබුලා ---------- (02)

ii. බජිරි / කුඩමැට්ට / කුනැස්ස එක් පිළිතුරක් සඳහා ---------- (01)

iii. a. සුදුසු ක්‍රමයක් සඳහා ---------- (01)

b. වකුගඩු රෝග / පිළිකා ඇති වීම ---------- (01)

(B) i. නිවැරදි අර්ථ දැක්වීම සඳහා ---------- (01)

ii. (a) වනාන්තර විනාශය / අක්‍රමවත් ජලපරිහරණය වැනි ක්‍රියාමාර්ගයක් සඳහා ---------- (01)

(b) ජල උල්පත් මතුවීම / ගොඩනැගිලිවල ඉරිතැලීම් වැනි කරුණක් සඳහා ---------- (01)

iii. සුදුසු ක්‍රියාමාර්ග 02 ක් සඳහා ---------- (02)

11